**ශීර්ෂය 196 – විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ, අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශනය විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 124 රෙගුලාසිය ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශිර්ෂය 196 - විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකුලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරිම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ජූලි 10 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වු විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.8 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හා සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය. විධිවිධානවලට අනුකූලව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය ඉටු කිරීමේදී අනාවරණය වු විගණන නිරීක්ෂණ සාරාංශගත කර පහත සඳහන් සටහනේ දක්වා ඇත.

| මුදල් රෙගුලාසි 127 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම.<br><br>(දෙපාර්තමේන්තු කටයුතු සිදු කළ යුත්තේ හුදෙක් මූල්‍ය හා දෙපාර්තමේන්තු නියෝගවලට අනුකූලව පමණක් නොව, රාජ්‍ය කටයුතු ඉටු කිරීමේදී බලාපොරොත්තුවන අවංකභාවය පිළිබඳ උසස් තත්ත්වයන්ට අනුකූල බව) | (i) අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරිම | 2.9 (අ) |
| | | (ii) ලේඛන හා පොත් පවත්වා නොතිබිම | 2.12 |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරිම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | (i) අනුකූල නොවිම් | 13 |
| | | (ii) මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු | 14 |

| | | | |
|---|---|---|---|
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සැකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | (i) අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම. | 2.3.1 (ආ) |
| | | (ii) අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගැනීම. | 2.3.2 (ඇ) |
| | | (iii) වත්කම්වල වටිනාකම හා ගුණාත්මකභාවය අඩුවීම. | |
| | | (iv) අනාර්ථික ගනුදෙනු | |
| 127(5) | දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලැකිය යුතු වෙනස්වීම් අමාත්‍යාංශයේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව | (i) සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම. | 2.9 (ආ) i |
| | | (ii) අධි ප්‍රතිපාදන සලසා තිබීම | 2.9 (ආ) ii |
| 127(6) | ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම පිට පවත්නා වූ ආදායම් නොහොත් රජයට ලැබිය යුතු වෙනත් ගාස්තු එකතු කිරීමේ කාර්යය ගැන දැඩි සෙවිල්ලෙන් සිටිමින් එම කාර්යය අමාත්‍යාංශයේ පරීක්ෂණයකට භාජනය කිරීම | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.10 |
| 127(7) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පැනවීමද, වගබලා | මුදල් සම්බන්ධව කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබා නොගැනීම. | 2.15 |

ගැනීම පිණිස විධිවිධාන යොදන ලද්දේනම් තමා වෙත පැවරී ඇති වගකීම්වලින් ගණන්දීමේ නිලධාරියා නිදහස් වූවාක් ලෙස සලකනු ලැබේ. රාජ්‍ය ගිණුම් කාරක සභාව හමුවේ පෙනී සිට, තමා වගකීම් දරන දෙපාර්තමේන්තුවල ගිණුම් පැහැදිලි කිරීමෙන් හා සාධාරණීය කිරීමෙන් ගණන්දීමේ නිලධාරියා සමඟ සහාය වීමද ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ රාජකාරී භාරයක් වීම.

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

---------------------------------------------

### 2.1 කාර්යසාධනය

----------------

#### 2.1.1 සැලසුම් කිරීම

----------------

අපේක්ෂිත ප්‍රධාන කාර්යයන් වූ ප්‍රතිපාදන වෙන් වූ අයවැය යෝජනා 08 ක් ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබූ රු.මිලියන 1,350 ක් අතර වියදම් කළ මුදල රු.මිලියන 440.43 ක් විය. ඉන් ප්‍රධාන කාර්යයන් 03 කට අදාල රු.මිලියන 575 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

#### 2.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම**

----------------------------------------------------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශය විසින් ප්‍රවර්ථන වර්ෂයේදී ප්‍රධාන කාර්යයන් 13 ක් ඉටු කළ යුතුව තිබුණත් පහත සඳහන් ප්‍රධාන කාර්යයන් 3 ක් ප්‍රසම්පාදන සැලසුම් පරිදි ඉටුකර ගැනීමට නොහැකි වීම හේතුවෙන් සලසා තිබුණු රු.මිලියන 575 ක ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරිව තිබුණි.

| | ඉටු නොකළ ප්‍රධාන කාර්යභාරය | සලසා තිබුණු ප්‍රතිපාදනය<br>(රු.මිලියන) |
|---|---|---|
| (i) | ආනයනික භාණ්ඩවල තත්ත්ව ආරක්ෂණය | 25 |
| (ii) | සංවර්ධනය සභාය යටතේ භාණ්ඩ නිර්මාණය කිරීමේ ඉංජිනේරු සේවා අරමුදලක් පිහිටුවීම | 500 |

(iii) ජාන විද්‍යාව පිළිබඳ විශිෂ්ඨත්වයෙන් යුත් මධ්‍යස්ථානයක් පිහිටුවීම 50

------------
575
========

**(ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉන්දු ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 9.255 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණත්, එම කාර්යයන්වල කාර්යසාධක දර්ශක සඳහන් කර නොතිබුණු නිසා කාර්යසාධනය අපේක්ෂිත පරිදි ඉටුකර නොතිබුණිද යන්න තහවුරු කරගත නොහැකි විය.

**(ඇ) අපේක්ෂිත ප්‍රතිලාභ අත්පත් කර ගැනීමට නොහැකි වීම**

2017 වර්ෂයේදී සූර්ය පැනල මූලාකෘති නිෂ්පාදනය සඳහා පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 20 ක ප්‍රතිපාදනය සලසා තිබුණි. එසේ වුවද ප්‍රසම්පාදනයන් සැලසුම් කළ පරිදි ඉටු කිරීමට නොහැකි වීම හේතුවෙන් රු.මිලියන 17.94 ක් ඉතිරි වී තිබුණි.

**(ඈ) තිරසර සංවර්ධන අරමුණු කරා ලඟා වීමේ සැපසුම් සකස් කිරීම**

තිරසර සංවර්ධන ඉලක්ක ලඟා කර ගැනීමට සුදානම් වීමේදී අනෙකුත් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් නොමැති වීම හේතුවෙන් ඉලක්කගත අරමුණු කරා ලඟා වීමට සැලසුම් සකස් කිරීමේදී හා පෙර සුදානම් වීමේ ක්‍රියාවලිය ඉතා දුර්වල මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

## 2.2 වත්කම් කළමනාකරණය

**(අ) රජය සතු වත්කම් උපරිම කාර්යක්ෂමතාවයකින් භාවිතා නොකිරීම**

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ එකිනෙක අංශ අතර තොරතුරු හුවමාරු කරගැනීම සඳහා අභ්‍යන්තර දුරකථන පද්ධතියක් ස්ථාපිත කර නොතිබූ අතර ඍජු දුරකථන හරහා තොරතුරු සන්නිවේදනය සිදුකරනු ලබයි. මේ හේතුවෙන් සන්නිවේදන පිරිවැය අවම කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

**(ආ) වාහන උපයෝජනය**

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂය අවසන් වන විට පහත සඳහන් පරිදි වාහන 15 ක් ධාවනයට යොදවා තිබුණි. එම වාහනවලින් කිලෝ මීටර් 138,930 ක් ධාවනය කර තිබුණු අතර, ඒ සඳහා ඉන්ධන හා ලිහිසි තෙල් සඳහා රු.2,043,204 ක්ද, වාහන සේවා කිරීම හා වාහන අළුත්වැඩියා සඳහා රු.4,599,238 ක්ද හා වාහන රක්ෂණය කිරීම සඳහා රු.1,027,468 ක්ද වශයෙන් එකතුව රු.7,669,910 ක් වැය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය විසින් වාහන

ධාවනය කිරීම සඳහා රියදුරු වැටුප් හා දීමනා හැර කිලෝ මීටරයක් සඳහා රු.55.21 ක් වැය කර තිබුණි.

| වාහන වර්ගය | සංඛ්‍යාව | වටිනාකම (රු.) | රියදුරු වැටුප් හා දීමනා හැර අනෙකුත් වියදම් (රු.) | ධාවනය කළ කිලෝ මීටර් ගණන (කි.මී.) | ධාවනය කළ කිලෝ මීටරයක් සඳහා වියදම (රු.) |
|---|---|---|---|---|---|
| වෑන් | 06 | 44,345,000 | 3,509,001 | 67,156 | 52.25 |
| කාර් | 06 | 33,862,500 | 2,649,226 | 44,848 | 59.07 |
| ජීප් | 01 | 23,000,000 | 836,255 | 22,600 | 37.00 |
| ඩබල් කැබ් | 02 | 11,000,000 | 675,428 | 4,326 | 156.13 |

වෑන් රථ 02 ක්, කාර් රථ 04 ක් හා එක් ඩබල් කැබ් රථයක් වෙනුවෙන් අධි පිරිවැයක් දරා තිබූ බව නිරීක්ෂණය විය.

**(ඇ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයට අයත් වාහන 04 ක් වසර 2 ට වැඩි කාලයක සිට ග්‍රහලෝකාගාර පරිශ්‍රය තුළ ගාල්කර තිබූ අතර ඒවා භාවිතයට ගැනීමට හෝ එසේ නැතිනම් අපහරණය කිරීමට 2018 අගෝස්තු 30 දින වන විටත් පියවර ගෙන නොතිබුණි.

(ii) කොබෙයිගනේ, මල්ලවපිටිය, මාස්පොත, පඩුවස්නුවර යන විද්‍යා මධ්‍යස්ථාන සතුව පවතින දරවායු ලිප, පොල්තෙල් නිස්සාරකය, යෝගට් ඉන්කියුබේටරය හා බේකරි උඳුන ආදිය අක්‍රීයව පැවති බැවින් හෝ භාවිතයට නොගෙන ඌන උපයෝජිතව පැවතුණි.

**(ඇ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා චක්‍රලේඛයේ 3.1.6, හා 3.2.6 ඡේදය ප්‍රකාරව 2018 ජූනි 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් විද්‍යා මධ්‍යස්ථාන 120 කට අදාළ වාර්තා 2018 ජූලි 31 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 2016 වර්ෂයට අදාල සමීක්ෂණ වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌණතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

**(ඉ)** **බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

**------------------------------------------------**

අමාත්‍යාංශය විසින් රු.මිලයන 9.39 ක් වටිනා මෝටර් රථයක් අවිධිමත් ලෙස සමාජ සවිබලගැන්වීම, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය වෙත මුදාහැර තිබුණි.

**2.3** **බැදීම් හා බැරකම්**

**-------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** **වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැදීම්වලට එළඹීම**

**--------------------------------------------------------------**

අමාත්‍යාංශය විසින් දරන බැරකම් සහ වැය ප්‍රමාණය කිසිම විටක මුදල් වර්ෂය සඳහා ප්‍රතිපාදන මුදල් නොඉක්ම විය යුතු වුවත් වැය විෂයන් 06 කට අදාළව රු.1,556,976 ක් ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට බැදීම් ඇති කරගෙන තිබුණි.

**(ආ)** **බේරුම් නොකළ බැරකම්**

**--------------------------------**

අමාත්‍යාංශය විසින් 2017 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් වටිනාකම රු.64,367,010 ක් විය.

**2.4** **පාඩු හා හානි**

**---------------**

(අ) ඇමතිවරයාගේ කැනඩා නිල සංචාරය කල් දැමීමට සිදුවීම හේතුවෙන් ඒ සඳහා වූ යානා පත්‍ර වෙනුවෙන් ගෙවන ලද රු.145,100 ක මුදල නැවත අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) 2016 වර්ෂයේ සිට සේවය හැර ගිය නිලධාරීන් දෙදෙනෙකුට සහනදායි පදනම මත ලබා දී තිබූ යතුරුපැදිවල වෙළෙඳපල වටිනාකම වූ රු.289,840 ක මුදල අයකර ගැනීමට හෝ යතුරු පැදි නැවත අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

**2.5** **අනාර්ථික ගනුදෙනු**

**-----------------------**

(අ) මල්ලවපිටිය, රිදිගම, මාස්පොත, පඩුවස්නුවර නැගෙනහිර සහ පොල්ගහවෙල යන විදාතා මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සඳහා කුලී මුදල් ලෙස එකතුව රු.782,400 ක් ගෙවා තිබුණද එම මධ්‍යස්ථානවලට අවශ්‍ය භෞතික හා මානව සම්පත් ලබා නොදීම හේතුවෙන් ප්‍රතිලාභීන් සඳහා අපේක්ෂිත සේවාවන් ලැබී නොතිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 23 දින සිට රිදිගම විදාතා මධ්‍යස්ථානයට විද්‍යා හා තාක්ෂණ නිලධාරියෙකු අමාත්‍යාංශය විසින් පත්කර නොතිබූ අතර ක්ෂේත්‍ර සම්බන්ධීකාරක නිලධාරියෙකු හා කාර්යාල කාර්ය සහයෙකු පමණක් මධ්‍යස්ථානයට අනුයුක්ත කර තිබුණි. මේ හේතුවෙන් 2015 වර්ෂයෙන් පසුව මෙම මධ්‍යස්ථානයෙන් කිසිඳු සේවාවක් ලබාදී නොතිබුණු අතර එම නිසා ඉහත නිලධාරීන් දෙදෙනා හට වැටුප් වශයෙන් ලද එකතුව රු.1,074,221 ක් ගෙවා තිබීම අනාර්ථික වියදමක් වී තිබුණි.

**2.6 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 1293 | 1111.54 | 181.46 | 14.03 |
| | මූලධන | 2474.16 | 1836.40 | 637.76 | 25.77 |
| | එකතුව | 3767.16 | 2947.95 | 819.21 | 21.75 |
| 2014 | පුනරාවර්තන | 1396.13 | 1285.91 | 110.22 | 7.89 |
| | මූලධන | 2520.97 | 2369.91 | 151.06 | 5.99 |
| | එකතුව | 3917.09 | 3655.81 | 261.28 | 6.67 |
| 2015 | පුනරාවර්තන | 1500.35 | 1425.78 | 74.57 | 4.97 |
| | මූලධන | 2256.55 | 1722.35 | 534.2 | 23.67 |
| | එකතුව | 3756.9 | 3148.13 | 608.77 | 16.20 |
| 2016 | පුනරාවර්තන | 1711.51 | 1600.21 | 111.3 | 6.50 |
| | මූලධන | 2366.74 | 1694.04 | 672.7 | 28.42 |
| | එකතුව | 4078.25 | 3294.25 | 784 | 19.22 |
| 2017 | පුනරාවර්තන | 1843.36 | 1721.90 | 121.46 | 6.59 |
| | මූලධන | 3931.10 | 1912.67 | 2018.43 | 51.34 |
| | එකතුව | 5774.46 | 3634.57 | 2139.89 | 37.06 |

සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) කාර්යභාරය ඉටු කිරීමට ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම**

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු ඉදිකිරීම් කාර්යයන් සඳහා රු.මිලියන 3.3 ක මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණත්, එම ඇස්තමේන්තුවේ සඳහන් ප්‍රතිපාදනය වෙනුවට රු.960,000 ක ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම කාර්යභාරයන් ඉටුකර නොතිබුණි. මේ නිසා සලසා තිබුණු රු.960,000 ක මුළු ප්‍රතිපාදනයම ඉතිරිකර තිබුණි.

**(ii) කාර්යයන් ඉටුකිරීමට යෝජිත කාල රාමුව ගැන නොසලකා ප්‍රතිපාදන සලසා ගැනීම**

අමාත්‍යාංශය විසින් ගොඩනැගිලි ඉදිකිරීම් හා මෘදුකාංග සංවර්ධනය සඳහා රු.මිලියන 27 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ශක්‍යතා අධ්‍යයනයන් හා ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළ කාර්යයන් ප්‍රමාදවීම හේතුවෙන් මුළු ප්‍රතිපාදනයම උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි.

**(iii)** **සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

වැය විෂයයන් 15 ක් සඳහා එකතුව රු.මිලියන 591.41 ක ප්‍රතිපාදන සලසා තිබුණු නමුත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයම කිසිදු උපයෝජනයක් නොකර ඉතිරි කර තිබුණි.

**(iv)** **අධි ප්‍රතිපාදන සලසා තිබීම**

වැය විෂයයන් 18 ක් සඳහා එකතුව රු.මිලියන 1,679.87 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 460.68 පමණක් උපයෝජනය කර තිබුණි. මේ හේතුවෙන් සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම් සියයට 54 ක සිට සියයට 99 ක් දක්වා වූ පරාසයක පැවතුණි.

## 2.7 අනුකූල නොවීම

### 2.7.1 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 1.7 වගන්තිය | අනුමත කරන ලද නිවාඩු පිළිබඳ රෙජිස්ටරයක් 190 වැනි පොදු ආකෘති පත්‍රය අනුව තබාගත යුතු වුවද, පඩුවස්නුවර හා කොබෙයිගනේ විදාතා මධ්‍යස්ථානවල එවැනි ලේඛණයක් පවත්වා නොතිබීම. |
| (ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| මුදල් රෙගුලාසි 751 | අමාත්‍යාංශයට ලැබුණ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ලේඛණගත නොකිරීම. |
| මුදල් රෙගුලාසි 891(1) | ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛණයක් පවත්වා නොතිබුණි. |

## 2.8 මානව සම්පත් කළමනාකරණය

### 2.8.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 485 ක් වැයකර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම් රු.530,634 ක් වී තිබුණි.

2017 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 23 | 20 | 3 |
| (ii) | තෘතියික මට්ටම | 29 | 3 | 26 |
| (iii) | ද්විතියික මට්ටම | 741 | 657 | 84 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 234 | 230 | 4 |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 4 | 4 | - |
| | එකතුව | 1031 | 914 | 117 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා බඳවා ගැනීම**

අනියම් සහ සහන පදනම මත බඳවාගෙන තිබූ මුරකරුවන් 80 දෙනෙකුගෙන් දෙදෙනෙකුගේ තනතුරු පමණක් අමාත්‍යාංශය විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරගෙන තිබුණි. සේවකයින්ගෙන් 77 දෙනෙකු මේ වන විටත් අමාත්‍යාංශයේ සේවයේ යොදවා සිටියද එම තනතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත වූ ඒවා නොවීය.

**(ආ) නිශ්කාර්ය මානව සම්පත්**

කොබෙයිගනේ විද්‍යාතා මධ්‍යස්ථානයට අනුයුක්තව පරිගණක දත්ත ක්‍රියාකරුවෙකු සිටියදවිද්‍යාතා මධ්‍යස්ථානයේ පරිගණක පුහුණු වැඩසටහන් පැවැත්වීමට අවශ්‍ය පරිගණක භාවිතයට ගත නොහැකි මට්ටමක පවතින බැවින් පරිගණක දත්ත ක්‍රියාකරුගේ සේවය ඌන උපයෝජිතව පැවතුණි.

**(ඇ)** **අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්**

අමාත්‍යාංශය විසින් සහකාර ලේකම් වෘත්තීය සමිති තනතුරට 2016 මාර්තු 08 දින සිට අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරියෙකු පත්කර ගෙන තිබූ අතර නිලධාරියා අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් කරගැනීම සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

**(ඈ)** **කාර්ය මණ්ඩලය පුහුණු කිරීම**

(i) 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වසර 05 ක කාල සීමාව තුළ අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩල පුහුණු කිරීම් කටයුතු සමාලෝචනය කිරීමේදී 2013, 2015 හා 2016 වර්ෂවලදී සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය වී නොතිබුණි.

(ii) 2017 වර්ෂයේදී 366 දෙනෙකු පුහුණු වීම් වැඩසටහනක් සඳහා සහභාගී කරවීම සඳහා සැලසුම් කලද වර්ෂය තුලදී 287 දෙනෙකු පමණක් පුහුණු වීම් වැඩසටහන්වලට සහභාගී වී තිබුණි. එසේම 79 දෙනෙකු කිසිදු ආකාරයේ පුහුණු වැඩසටහනකට සහභාගී වී නොතිබුණි.

(iii) අමාත්‍යාංශය විසින් 2017 වර්ෂයේ කාර්ය මණ්ඩල පුහුණු කිරීම වෙනුවෙන් රු.4,552,436 ක ශුද්ධ ප්‍රතිපාදනයක් සලසා තිබුණි. ඒ අනුව එක් නිලධාරියෙකු පුහුණු කිරීම වෙනුවෙන් රු.15,862 ක් දරා තිබුණි.

**2.9** **රජයේ නිලධාරීන් ඇප තැබීම**

රජයේ මුදල්, ආදායම්, මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම, හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදා හැරීම, හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම, සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන්ද, රජයේ ගිණුමට අදාළ වවුචර් සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද, ස්වකීය රාජකාරි කටයුතු අවංකව ඉටු කරන බවට 612 වැනි අධිකාරය හා මුදල් රෙගුලාසි අංක 880 රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතුය. ඉහත කාර්යභාරවල නියුක්ත අමාත්‍යාංශයේ නිලධාරීන් ඇප තැන්පතු තබා නොතිබුණි.